"විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු."

ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011-2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011-2092601
ඊ-මේල් / ஈ-மெயில் / Email chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி / General Telephone 011-2093000

මගේ අංකය. / எனது இல. / My No. CSWP/ADM/18-38/FI/01-2019

ඔබේ අංකය. / உமது இல. / Your No.

දිනය. / திகதி. / Date. 2019.03. 01

**පළාත් චක්‍රලේඛ : 08/2019**

පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන් (බ.ප),

<u>**බස්නාහිර පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ සහ පළාත් ගරු අමාත්‍යවරුන්ගේ සහය කාර්යය මණ්ඩලයට අයත් කළමනාකරණ සහකාර සහ ප්‍රාථමික සේවා ගණයට අයත් සේවකයින් ස්ථිර කිරීම.**</u>

බස්නාහිර පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ සහ පළාත් ගරු අමාත්‍යතුමන්ලාගේ සහය කාර්ය මණ්ඩලය සඳහා පළාත් රාජ්‍ය සේවයෙන් පරිබාහිරව බඳවාගත් පහත සුදුසුකම් සපුරන සේවකයින් ස්ථිර කිරීමට බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් තීරණය කරනු ලැබ ඇත.

I. බස්නාහිර පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ සහ ගරු අමාත්‍යතුමන්ලාගේ සහය කාර්ය මණ්ඩලයට පළාත් රාජ්‍ය සේවයෙන් පරිබාහිරව බඳවාගෙන සිටින කළමනාකරණ සහකාර සේවයේ හා ප්‍රාථමික සේවා ගණයට අයත් තනතුරක සති අන්ත හා රජයේ නිවාඩු දින ද ඇතුලත්ව වසර 03 ක අඛන්ඩ සේවා කාලයක් ඇති සේවකයෙකු වීම.

II. පත් කරනු ලබන තනතුරුවලට අදාල අනුමත සේවා ව්‍යවස්ථා හෝ බඳවා ගැනීමේ පරිපාටිවලට අනුව නියමිත සුදුසුකම් සපුරා තිබීම.

02. මේ යටතේ සුදුසුකම් ලබන සියළුම සේවකයින් පහත සඳහන් විධිවිධාන අනුව ස්ථිර සේවයට පත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගතයුතුය.

I. කළමනාකරණ සහකාර තනතුරුවලට පත්කර ඇති සේවකයින් බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ තනතුරුවලට වඩා පහළ සේවා ගණයේ දෙපාර්තමේන්තුගත තනතුරුවලට පත් කිරීම.

II. ප්‍රාථමික සේවා ගණයට අදාල සේවකයින් බස්නාහිර පළාත් ප්‍රාථමික සේවාවන්වලට,ඒකාබද්ධ සේවාවන්ට අයත් සේවා ව්‍යවස්ථාවල සඳහන් නියමිත සුදුසුකම් සපුරා ඇත්නම් ඔවුන් එකී සේවාවන්ට අයත් තනතුරුවලට පත් කිරීම.

III. සේවකයින් තනතුරුවලට පත්කිරීම සඳහා තම පළාත් අමාත්‍යාංශයේ හෝ තම පළාත් අමාත්‍යාංශයට අයත් ආයතනවල තනතුරු පුරප්පාඩු නොමැතිනම් අනෙකුත් පළාත් අමාත්‍යාංශවල ලේකම්වරුන් විමසා එකී තනතුරුවලට පත්කිරීමට අදාල පියවර ගැනීම.

IV. එලෙස ස්ථිර තනතුර සඳහා පත්කරන ලද සේවකයින් ගරු පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගේ /පළාත් ගරු අමාත්‍යවරුන්ගේ ධූරකාලය අවසන් වීමෙන් අනතුරුව පමණක් ස්ථිරව පත්කරනු ලැබූ පළාත් අමාත්‍යාංශයට හෝ දෙපාර්තමේන්තුවට අනුයුක්ත කිරීම.

03. මෙම චක්‍රලේඛය රාජ්‍ය පරිපාලන කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය විසින් 2018.08.23 දැනැතිව නිකුත්කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 17/2018 සමගාමීව නිකුත් කරනු ලැබේ.

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

__පිටපත__ : 01. ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.) - කරු.දැ.ගැ.ස. සහ අ.ක.ස.